**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහන - 3 කොටස - 2018**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 3 කොටසේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 අගෝස්තු 11 දින එළඹි අංක 3348 සහ 3349 දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

ණය ගිවිසුම්වලට අනුව අභ්‍යන්තර සහ ස්වදේශ කටයුතු සහ පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා වැඩිදියුණු කිරීම හා කළමනාකරණය කිරීම සහ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජල සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වැඩ සටහනේ අරමුණ වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 16,401.76 කට සමාන එජඩො මිලියන 112.83 ක් වූ අතර, ඉන් රු.මිලියන 13,083.03 කට සමාන එජඩො මිලියන 90 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,318.73 ක් ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. වැඩසටහන එහි කාර්යයන් 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, වැඩසටහනේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

වැඩසටහන වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩුව

| ගිණුම්කරණ අඩුපාඩුව | මුදල<br><br>රු.මිලියන | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| විදේශ විනිමය ගණුදෙනු මත විනිමය ලාභය ජංගම නොවන වත්කම් වල වටිනාකමින් අඩුකර තිබුණි. | 3.22 | ජංගම නොවන වත්කම්වල වටිනාකම අඩුවෙන් දැක්වේ. | අදහස් දක්වා නොමැත. | ජංගම නොවන වත්කම්වල සාධාරණ අගය දැක්විය යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6 (01) (අ) වගන්තිය | පිරිවැය රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් පිළිගත් කොන්ත්‍රාත්කරුවන් විසින් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතු අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේ වෙතත්, සිවිල් ඉදිකිරීම් සහ සැපයුම් කොන්ත්‍රාත්කරුවන් මෙම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි. | නීතිමය සහ බඳු සම්බන්ධ ගැටළු මත කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව පියවර ගැනීමට නොහැකි වේ. | නීතිමය අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට දැනුම්දීමට පියවර ගෙන තිබුණි. | මෙම අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට පෙළඹවීමට පියවර ගැනීමට අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 වැඩසටහනේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ආයතනික සහ මෙහෙයුම් ධාරිතාවය ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය සහ ආයතනික සහාය යනාදි සංරචක 03 ක් යටතේ වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව, වැඩ ආරම්භ කිරීමේ ප්‍රමාදයන්, උපයෝගීතා නිෂ්කාශනය සඳහා අනුමැතින් ලැබීමට කාලය ගතවීම, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය භාවිතයේ ප්‍රමාදයන් හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ කටයුතුවල ප්‍රගතිය ඉලක්කවලට පිටුපසින් පැවතුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය යොදා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2018 ඔක්තෝබර් මස පිරිනැමීමට සැලසුම් කළ වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් 31 දින වන විටත් පිරිනමා නොතිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 01 | විවෘත කපුම් නල එලීම්, මැන්හෝල් ස්ථාපනය සහ ක්ෂුද්‍ර උමං ඉදිකිරීම් සඳහා අමතර කොටස් සැපයීමේ ප්‍රමාදවීම්, ප්‍රමාණවත් නොවන මානව සහ භෞතික සම්පත් යෙදවීම හේතුවෙන් කිරුළපන මලාපවහන ජාලයේ අධීක්ෂණ කටයුතු මන්දගාමීව පැවතුණි. | කටයුතු නිම කිරීමේ ප්‍රමාදයන් සහ අපේක්ෂිත පහසුකම් ප්‍රතිලාභීන් වෙත ලඟා නොවිය හැක. | කටයුතුවල භෞතික ප්‍රගතිය ඉහල නැවීමට සහ කොන්ත්‍රාත්තුවේ වියපැහැදම් ඉලක්ක සපුරා ගැනීම සඳහා වර්තමානයේ කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යසාධන සහ සම්පත් වෙන්කිරීම මනා ලෙස නියාමනය කරනු ලැබේ. | කාර්ය මණ්ඩලය සහ යන්ත්‍රෝපකරණ වැඩි කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| 02. | දකුණු පෝෂක ප්‍රදේශයේ කිරුළපන, නාරාහේන්පිට මලාපවහන ජාල ඉදිකිරීම, පොල්වත්තේ සිට බම්බලපිටිය දක්වා මූලික මලාපවහන ඉදිකිරීම සහ දෝෂ සහිත මලාපවහන අළුත්වැඩියාව සහ අඩු ධාරිතාවයෙන් යුත් මලාපවහන ඉහල නැංවීමේ කොන්ත්‍රාත් 2018 දෙසැම්බර් මස පිරිනැමීමට සැලසුම් කර තිබුණද 2019 ජුනි 30 දින වන විටත් පිරිනමා තිබුණි. | ප්‍රතිලාභීන් වෙත අපේක්ෂිත පහසුකම් ලඟා නොවනු ඇත. | පූර්ව ප්‍රසම්පාදන කටයුතු මේවන විටත් අවසන් කර ඇති අතර කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන කටයුතු කර ගෙන යාමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. | කොන්ත්‍රාත්තුව ප්‍රදානයට කිරීමට කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය වේ. |

### 3.3 පාරිසරික කරුණු සම්බන්ධයෙන් ගැටළු

| විගණන ගැටළු | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2018 ඔක්තෝබර් 22 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘතියේ පරිසර නිලධාරියා ඉවත්ව තිබුණි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ පාරිසරික කාර්ය සාධනය නිරන්තරයෙන් නියාමනය කළ යුතු අතර ඒ පිළිබඳ වාර්තා ණය නියෝජිතායතනය වෙත අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ පාරිසරක තක්සේරු නිරන්තරයෙන් සිදුකිරීමට නොහැකි වේ. | පරිසර නියාමන අවශ්‍යතාවය සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා තාවකාලික විධිවිධාන යොදා ඇත. පුරප්පාඩුව පිරවීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත. | ව්‍යාපෘතියේ කටයුතු පරිසරයට සංවේදී බැවින් මෙම අවශ්‍යතාවය අනිවාර්ය වේ. එම නිසා පරිසර නිලධාරියකු බඳවා ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළු

| කාර්ය මණ්ඩල තනතුරු | 2018 දෙසැම්බර් 31 දිනට | | | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු තනතුරු | | | |
| ඉදිකිරීම් ඉංජිනේරු | 2 | 1 | 1 | ව්‍යාපෘතියේ කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වය බලපානු ඇත. | වැඩබිම්වල ඉදිකිරීම් අධීක්ෂණ රාජකාරි සඳහා සඳහන් මෙම තනතුරු අවශ්‍ය වේ. අදාල කොන්ත්‍රාත් පිරිනමන තෙක් සමහර තනතුරු සඳහා බඳවා ගැනීම ප්‍රමාද වී ඇත. | සුදුසු පුද්ගලයින් යෙදවීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| ව්‍යාපෘති ඉංජිනේරු | 8 | 2 | 6 | | | |
| සහකාර ව්‍යාපෘති ඉංජිනේරු | 7 | 3 | 4 | | | |